ඩිජිටල් පුවැසිභාවය

ඩිජිටල් පුරවැසිභාවය

2020 මාර්තු මස

ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය (NCEASL) විසින් මෙහෙයවන ලද

Minor Matters විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

Creative Commons Attribution-ShareAlike 3.0 IGO (CC-BY-SA 3.0 IGO) බලපත්‍රය යටතේ මෙය භාවිතා කළ හැක. **(http://creativecommons.org/licenses/by-sa/3.0/igo/)**

නිර්මාණය:

ඉන්ස්පීරියා ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම

දුරකථනය: +94 777 466346
ඊමේල්: inzperia.creations@gmail.com
වෙබ් අඩවිය: www.inzperia.com

හියවර හෙළු

කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන චිත්‍ර: සුගප්‍රදා සෝමාස්කන්ද අයියර්

ඩිජිටල් ආරක්ෂණය

හැඳින්වීම


ජංගම දුරකථන, ටැබ්ලට් පරිගණක සහ පරිගණක වැනි ඕනෑම ඩිජිටල් පද්ධති සහිත උපාංගයක් භාවිතා කරන විට දී අපි, අපේ පෞද්ගලික තොරතුරු එයට ඇතුළත් කරන්නෙමු. නමුත් එම තොරතුරු අප පවුලේ සංවේදී දත්ත හෝ අපගේ සේවා ස්ථාන වල ඇති ඉතා වැදගත් දත්ත විය හැක. මෙම දත්ත වලට පින්තූර සහ වීඩියෝ වැනි නිර්මාණාත්මක දේවල් ද ඇතුළත් වේ.

අපේ දත්ත සහ උපාංග (ඩිජිටල් ලෝකයට ප්‍රවේශ වීමට භාවිතා කරන ජංගම දුරකථන, ලැප්ටොප් ආදිය) ආරක්ෂා කරගැනීම ඉතා වැදගත් වන අතර, අන්‍යයන්ගේ දත්ත සහ උපාංගවල ආරක්ෂාව ගැන ද සැලකිලිමත් විය යුතුයි. අන්තර්ජාලය යනු අප සැවොම එකිනෙකා හා සම්බන්ධ වන ස්ථානයක් නිසා, එක් අයෙකුගේ ආරක්ෂාව දුර්වල වුවහොත් එය සෑම කෙනෙකුටම බලපෑමට ඇති හැකියාව ඉහළ බැවින්, සියල්ලන්ම තමන්ගේ ආරක්ෂාව උපරිම මට්ටමකින් පවත්වාගැනීමට වගබලාගත යුතුය.

ඩිජිටල් ආරක්ෂණය සහ සයිබර් ආරක්ෂණය යනු සංකීර්ණ හෝ දුෂ්කර ආරක්ෂක පද්ධති නොවේ. ප්‍රශ්නයක් පැනනැගුණ අවස්ථාවල දී සමහර විට ඊට ඇති හොඳම විසඳුම තාක්ෂණික බවින් අවම සහ ඉතා සරල විය හැක. එසේම අන්තර්ජාලය ආශ්‍රිතව අපගේ ආරක්ෂාවට එල්ල වන තර්ජනවලින් ආරක්ෂා වීමට තරම් අපගේ ආරක්ෂක පද්ධති ඉහළ තත්වයකින් පවත්වාගත යුතුය.











පුතේ.. මම අම්මා, අරින්න දොර..
ඩොක්
ඩොක්
මේ එනෝ!



හා හා හා
මේක මගේ
ගෙදර දැන්.
දබැස්


ඊලඟ දවස...
ටොක් ටොක්
පුතේ.. මම අම්මා. අරින්න දොර.
අම්මා?.. අද එනවා කිවුවෙ නෑනෙ.
බලන්න ඕනෙ කවුද කියල.
අඩුඅම්මෝ!


හොඳ වෙලාවට මම බැලුවෙ. මේ අර වෘක නඩියනෙ.
ඉන්නකෝ හොඳ පාඩමක් උගන්නම් මම.
ක්ලික්!
ඌයෙ!
පුංචි උගුරු පැටියාගේ ගෙදර අමතර ආරක්ෂණයක් තිබුනා.
ටූ ස්ටෙප් ඔතෙන්ටිකේශන් යනු ඔබේ මුර පදය හැරුනු විට තවත් ආරක්ෂණයක් ඔබේ ගිනුමට භාවිත කිරීමයි.
සාමාන්යයෙන් එය ඔබගේ පිවිසුම නැවත තහවුරු කිරීම සඳහා ඔබගේ දුරකථනයට එවන කේතයකි.
ටූ ස්ටෙප් ඔතෙන්ටිකේශන් ආරක්ෂාව සඳහා වඩා හොඳයි.


ඒ වගේම ලේසියෙන් අනුමාන
කල නොහැකි ශක්තිමත්
මුරපද භාවිතා කරන්න.


මට කළ හැකි වෙන
දේවල් මොනවාද?


• සමාජ ජාලා වෙබ් අඩවි වල ආරක්ෂක සැකසුම් යාවත්කාලීන කිරීම.
• අන්තර්ජාලයේ පෞද්ගලික තොරතුරු ඇතුලත් කිරීමේදී ප්‍රවේසම් වීම.
• ඔබගේ උපාංගවලට හානිදායක දේ බාගත විය හැකි අනාරක්ෂිත වෙබ් අඩවි වලින් ඈත් වී සිටින්න.
• ඔබගේ ප්‍රති - වයිරස මෘදුකාංග නිතර යාවත්කාලීන කරන්න.
• අනාරක්ෂිත බාගත කිරීම් වලින් වැලකී සිටින්න.

උගත් පාඩම්

- අපගේ ගිණුම් ආරක්ෂා කරගැනීම සඳහා සවිමත් මුරපද භාවිතා කිරීම අතිශයින්ම වැදගත් වේ.

- දෙපියවර සත්‍යාපනය භාවිතා කරන්න (two-factor authentication)
  ඔබ යොදන ප්‍රධාන මුරපදයට අමතරව, තවත් කේතයක් ඔබගේ ජංගම දුරකතනයට හෝ ඔබගේ විද්‍යුත් තැපෑලට (E-mail) ලැබීමට සැලැස්වීමෙන් ඔබගේ ගිණුම්වල ආරක්ෂාව තවත් තර කරගත හැක.

- Facebook, Instagram වැනි සමාජ ජාල ගිණුම්වල ආරක්ෂක සැකසුම් යාවත්කාලීන කිරීම, එම ගිණුම් ආරක්ෂිතව පවත්වාගැනීම සඳහා වැදගත් වේ.

- අන්තර්ජාලයේ සැරිසරන විට පෞද්ගලික දත්ත හුවමාරු කරගැනීමේ දී පරිස්සම් විය යුතුයි.

- ඔබේ උපාංගවලට හානිකර විය හැකි වෙබ් අඩවිවලට ප්‍රවේශ නොවන්න.

- නොදන්නා වෙබ් අඩවි වලින් මෘදුකාංග බාගත කිරීමෙන් වළකින්න.සෑමවිටම වයිරස් ආරක්ෂණ මෘදුකාංගයක් භාවිතා කරන්න, එය නිතරම යාවත්කාලීන කරන්න.

මියාව් පුවත්!



කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන චිත්‍ර: ට්‍රිෂාන් ප්‍රනාන්දුපුල්ලේ

ව්‍යාජ පුවත්

හැඳින්වීම

ඩිජිටල් පද්ධති පිළිබඳ ඔබේ දැනුම හෙවත් ඩිජිටල් සාක්ෂරතාවයේ වැදගත්ම අංගයක් වන්නේ දත්ත සොයාගැනීම පමණක් නොව එම දත්තවල නිවැරදි බව ද පරීක්ෂා කිරීම යි. ඒ සඳහා ඔබ තොරතුරු ලබා ගත් මූලාශ්‍රය / ස්ථානය විශ්වාසකටයුතු එකක් ද යන්න පරීක්ෂා කළ යුතුය.

ව්‍යාජ පුවත් යනු වර්තමානයේ ජනප්‍රිය වදනක් වුවත්, එහි සත්‍ය - අසත්‍යතාව තහවුරු කරගැනීම අපහසුය. මන්ද එය විවිධ ආකාර විය බැවිනි:

- අසත්‍ය තොරතුරු (සිතාමතා ප්‍රචාරය කරන ව්‍යාජ තොරතුරු)
- වැරදි තොරතුරු (නොදැනුවත්ව ප්‍රචාරය කරන අසත්‍යයන්)
- අනිෂ්ට තොරතුරු (සමාජයට හානියක් කිරීමේ අරමුණින් පතුරන ව්‍යාජයන්)

ව්‍යාජ තොරතුරු සහ ජායාරූප කාලාන්තරයක් තිස්සේ පැවතගෙන එන්නකි. කෙසේ වෙතත් 21 වන සියවසේ දී අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය භාවිත කොට ගෙන මෙවැනි දෑ ප්‍රචාරණය කිරීම පහසු වී ඇත. මේවා නිසා විශාල හානි සිදුවිය හැක: මෙයින් සමාජයට බලපෑම් ඇති විය හැක, ආගමික හෝ වාර්ගික කණ්ඩායම් අතර වරදවා වටහාගැනීම් හා ආරවුල් ඇති විය හැක, මැතිවරණවල දී ඡන්දදායකයින්ව ව්‍යාකූල කළ හැක, ප්‍රචණ්ඩත්වයට දිරි දීම මගින් සාමකාමී සමාජයකට තර්ජනයක් එල්ල කිරීමට පවා ඉඩ ඇත.



මී... ලබු කිරිබත් හරි සුවඳයි.
රස ඇති.
මේක නම් බෙදා ගන්න බෑ.


හා හාමී ලබු කිරිබත් නැට්ට නැති කැන්ද කොළේ කැවම රස වැඩීලු.
කොළ ටිකක් හොයන් එනවද?
හිහ් හිහ් හිහ් !!!
කොහෙද මේ නැට්ට නැති කොල?
කැන්ද!
අයියෝ... නැට්ට තියනවනේ..
මී...
මෙහෙ නෑ. මට බඩගිනී දැන්.


බඊය...
මොකක්ද
!*#@#$%!*#$!!
!*#@#$%!*#$!!
මට නැගිටින්න උදව් කරන්න
Post
#Justi


පෝස්ට් එක වයිරල් ගියා.
#JusticeForFox
Share
හාවා නරියාට පහර දෙයි.
නරියාට අසාදාසී.
හාවාට මේකෙන් බේරෙන්න දෙන්න බෑ..
මේක වැරදි වැඩක්.
මේ... මේක කියෙව්ව ද?
හාවා නරියාට පහර දෙයි?
මට ඇහුනා නරිය ICU එකේලු.
ඇත්තද?
මාධ්‍ය සාකච්ඡා


නරියගේ අයිතීන් රකිමු.
අපි නරියාට
හාවා
නරියාට යුක්තිය!
නීතිය නිදි?
මෙයාල ඉස්සෙල්ලාම වතාවට මගේ පැත්තෙ.
මට යුක්තිය!


අත්අඩංගුවට ගමු.
මං මුකුත් කලේ නෑ
හුරේ!!!
අහිංසක හාවා අසත්‍ය තොරතුරු නිසා අමාරුවේ වැටුනා.
ඔබ share කරන තොරතුරු අසත්‍ය විය හැකිය. වැරදි තොරතුරු ප්‍රචාරය කෙනෙකුට හානිකර විය හැක.

උගත් පාඩම්

ව්‍යාජ පුවත් හඳුනාගැනීම සඳහා උපදෙස්

- අර්ථයක් නැති පුවත් පිළිබඳව අවධානයෙන් සිටින්න.
- අදාළ පුවත ප්‍රකාශයට පත්කළ වෙබ් අඩවියේ කුමක්දැයි පරීක්ෂා කරන්න.
- ව්‍යාජ වෙබ් අඩවි ලිපින ගැන අවධානයෙන් සිටින්න.
- ප්‍රවෘත්තියට නොගැලපෙන සිරස්තල පිළිබඳව අවධානය යොමු කරන්න.
- අසාමාන්‍ය වැරදි සහ අක්ෂර වින්‍යාසයන්ට අවධානය යොමු කරන්න.
- මිනිසුන් කෝපයට පත් කිරීමට, ඇවිස්සීමට උත්සාහ දරන සිරස්තල ගැන සැලකිලිමත් වන්න.
- ජනප්‍රිය පුද්ගලයින්ගේ නම්වලින් ඇති ව්‍යාජ ගිණුම් මගින් පතුරුවා ඇති ව්‍යාජ තොරතුරු පිළිබඳව සොයා බලන්න.
- ඡායාරූප වේ නම්, ඒවා Googleහි සර්ච් කර බලන්න.
- ඔබට යමක් අවිශ්වාස කටයුතු නම්, ඔබට විශ්වාසී අයෙකු ට යවා නැවත වරක් පරීක්ෂා කරන්න.



කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන චිත්‍ර: ප්‍රභාෂණ හස්තිධර

ඩිජිටල් පියසටහන්

හැඳින්වීම


අපට අවශ්‍ය වුවත් නැතත්, දිනපතාම පාහේ අපි බොහෝ දෙනෙක් අන්තර්ජාලය හරහා අප ගැන වැඩෙන ප්‍රතිරූපයකට දායක වනමුත්, ඒ ප්‍රතිරූපය අප සිතනවාටත් වඩා ප්‍රසිද්ධ එකකි.


අන්තර්ජාලයේ සැරිසැරීමෙන් පසු ඔබ එහි දමා යන සියල්ල ඩිජිටල් පියසටහන් යනුවෙන් හැඳින්වේ. සමාජ මාධ්‍ය, ස්කයිප් ඇමතුම්, යෙදුම් භාවිතය සහ විද්‍යුත් පණිවිඩ වාර්තා ද ඔබගේ අන්තර්ජාල ඉතිහාසයේ කොටසක් වන අතර, ඒවා අනෙක් පුද්ගලයින්ට ද දැකිය හැකිය.

මේවා වෙළෙඳ ආයතනවලට ඔබේ රුචිකත්වයට අනුව දැන්වීම් ඉදිරිපත් කිරීමට සහ සේවායෝජකයන්ට ඔබේ පසුබිම සොයා බැලීමට ද උපකාර කරයි. ඔබ අන්තර්ජාලයේ කරන ඕනෑම දෙයක් ඩිජිටල් පියසටහන්වලට ඇතුළත් වීමේ හැකියාවක් තිබේ.

https://www.internetsociety.org/tutorials/your-digital-footprint-matters/


ලියුමක් ඇවිත්?
පුතා හොඳට පාස් වෙලා.
හුරේ!
O/L
A
A
A
A
A
ලැප්ටොප් එකක්?
මේක තමා හොඳම තෑග්ග.


දැන් බලන්න
Register
මෙලෝ රහක් නෑ
COMMENT
POST
SHARE
ඔහු දිගටම අන්තර්ජාලයේ නරක පිය සටන් ඉනිරි කලා.


ශිෂ්‍ය නායක බැජ් එකට අයදුම් කරාද?
ඔව්. මට සම්මුඛ පරීක්ෂණය හෙට.
HEAD PREFECT


මේ මගේ ලොකු හීනයක්.
අපි දැනුම් දීමක් කරන්නම්.
හරිම හොඳ CV එකක්.
බොහොම ස්තූතියි!
අද හොඳම කෙනා.
මමත් එයාට කැමතී.
ඒත්...
මම එයාව සර්ච් කරල බැලුවා. හරිම නරක දේවල් දාල තියනවා.
එහෙනම් අපිට එයාව ශිෂ්‍ය නායක කරන්න බෑ නේ.
ඔව් ඒක ඉස්කොලෙට හරි නෑ..
මෙතුරට ශිෂ්‍ය නායක කම නැති උනා, එයා අන්තර්ජාලයට එල නරක දේවල් නිසා.
ඔබ අන්තර්ජාලයට එකතු කරන දේ සදාකල් පවතී.

උගත් පාඩම්

ඩිජිටල් පියසටහන් කළමනාකරණය

- ඔබේ අනන්‍යතාව රැකගන්න, පරිස්සමෙන් හා ගෞරවාන්විතව අදහස් ඉදිරිපත් කරන්න.
- ඔබේ රහස්‍යතා සැකසුම් පරීක්ෂා කිරීමට වගබලාගන්න.
- ඔබ සතුව තිබෙන ගිණුම්වල ලැයිස්තුවක් තබාගනිමින්, ඔබ තවදුරටත් භාවිතා නොකරන ගිණුම් මකා දමන්න.
- ඔබේ තොරතුරු සඳහා සොයාගත හැක්කේ කාටද යන්න ගැන අවධානයෙන් සිටින්න.
- ඔබ ගැන Google හරහා සොයා බලන්න - ඔබට ලැබෙන ප්‍රතිඵල ඔබව පුදුමයට පත්කරනු ඇත.
- ඔබ පණිවිඩයක් යවන විට හෝ පින්තූරයක් පළකරන සෑම අවස්ථාවකම එය අන්තර්ජාලයේ සදහටම පවතින බව මතක තබා ගන්න.
- Trace my shadow - myshadow.org වැනි ඩිජිටල් මෙවලම් භාවිතා කරමින් ඔබගේ ඩිජිටල් පියසටහන් කළමනාකරණය කළ හැක.

ඩිජිටල් යහපැවැත්ම



කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන චිත්‍ර: පූර්ණිමා මීගම්මන


ඩිජිටල් යහපැවැත්ම

හැඳින්වීම

අපගේ එදිනෙදා ජීවිතයට ඩිජිටල් උපාංග සහ සේවාවන් අවශ්‍ය නමුත්, ඉන් අපේ සෞඛ්‍යයට බලපෑමක් සිදු නොවන ආකාරයට අප ඒවා කළමනාකරණය කළ යුතුය - මෙයට ශාරීරික හා මානසික සෞඛ්‍යය යන දෙකම ඇතුළත් වේ. ඔබ දිනකට පැය කිහිපයක් ඩිජිටල් තිරයක් දෙස බලා සිටින්නේ නම්, විශේෂයෙන් ඔබ සිටින්නේ වාඩි වී නම්, සෞඛ්‍ය ගැටලු ඇති විය හැක.


දීර්ඝ කාලයක් තිස්සේ ඩිජිටල් උපාංග භාවිතා කිරීම අපගේ මනසට සහ මනෝභාවයන්ට ද බලපාන අතර, එයින් අන් අය සමඟ ඇති අපේ සබඳතාවලට පවා හානි සිදු විය හැක.



Cereal
MILK


BUS
STOP








376 Liked




HAPPY BIRTH DAY
HAPPY NEW YEAR




ලොක්කා?
දැක්කද? වැරදි ඉරියව්වෙන් ඩිජිටල් උපාංග භාවිතය ඔබේ ඇස් පෙනීම, ඇසීම, බෙල්ල සහ කොන්දට බරපතල ගැටළු ඇති කළ හැකිය.
ඒනිසා මානසික ගැටලු ද ඇති විය හැකි.

උගත් පාඩම්

ඩිජිටල් මෙවලම් නිසා සෞඛ්‍යයට ඇති විය හැකි බලපෑම් අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

- ඔබේ පරිගණකය, ඔබේ ඇස්වලින් අඟල් 20ත්, 30ත් (සෙ.මී. 50 - 76) අතර දුරකින්, ප්‍රමාණවත් ආලෝකයක් සහිතව තබන්න.

- ඔබේ ඇස් ගැන සැලකිලිමත් වන්න. ඇසිපිය හෙලීමට අමතක නොකරන්න! පරිගණකයක් භාවිතා කරන විට අපි සාමාන්‍ය අවස්ථාවන්ට සාපේක්ෂව ඇසිපිය හෙලන්නේ අඩුවෙනි.

- ඇස් සඳහා 20-20-20 විවේකයක් ගන්න, එනම් සෑම විනාඩි 20කට වරක්, අවම වශයෙන් අඩි 20ක් දුරින් ඇති යමක් දෙස තත්පර 20ක් බැලීම.

- නින්දට යන විට ඩිජිටල් උපාංග ඔබ සමීපයෙන් තබාගන්න එපා. ඔබේ නිදාගැනීමේ රටාවන්ට බාධා නොවන ආකාරයට, නින්දට යාමට පැයකට හෝ දෙකකට පෙර ඔබේ සියලු ඩිජිටල් උපාංගවල තිර ක්‍රියාවිරහිත කර, ඔබේ ඇස්වලට විවේකයක් ලබා දෙන්න.

- නිරන්තරයෙන් පහත බැලීමෙන් වැළකෙන ලෙසින්, ඔබේ ලැප්ටොප් පරිගණකය ඔබේ ඇස් මට්ටමට ඔසවා තබාගන්න.

- ව්‍යායාම කරන්න. ඔබ ඉගෙන ගන්නා විට හෝ වැඩ කරන විට දී සරල ව්‍යායාම කිහිපයක් කිරීමට කෙටි විවේකයක් ගන්න.

වෙරි පුකාශ



කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන චිත්‍ර: අකලංක ගමගේ

වෛරී ප්‍රකාශ


හැඳින්වීම

සෑම කෙනෙකුටම තම සිතුවිලි හා අදහස් බෙදාහදා ගැනීමට අයිතියක් ඇත. නමුත් අන් අයට හිංසා කිරීමට දිරිගැන්වීම සඳහා කතා කිරීමේ අයිතිය අවභාවිතා කළ නොහැක. සාමාන්‍යයෙන් මේවා වෛරී ප්‍රකාශ ලෙස හඳුන්වයි.

වෛරී ප්‍රකාශ අන්තර්ජාලයේ හා සාමාන්‍ය ව්‍යවහාරයේ ද දක්නට ලැබේ. එහි දී හොඳ සහ ප්‍රයෝජනවත් විවේචන කිරීමේ වරදක් නොමැත, එහෙත් හානියක් සිදුවීමට තුඩු දෙන ආකාරයේ ප්‍රකාශ සම්පූර්ණයෙන්ම වළක්වා ගත යුතුය.


හුරේ! මම දිනුම්.
ඊලඟ පාර බලමු ෆාතිමා.
හා හා හා
_ෆාතිමා_
ඇපේ සේට් එක.
Best Friends
ඊලඟ දවස...
හදිසි ප්‍රවෘත්ති
අනේ දෙයියනේ!
හදිසි ප්‍රවෘත්ති




හදිසි ප්‍රවෘත්ති
පාස්කු ඉරිදා ප්‍රහාරය
දැනට බෝම්බ පහක් පුපුරා ඇති බවට වාර්තා වේ.


අපේ සේව් එක
හැමෝම හොඳින් නේද?
මං අහිටයි ලෝගන්ටයි කතා කලා
මේක නම් හරි දුකයි.
ඔයාල පරිස්සම් වෙන්න හොදේ?
මට ඇහුනා, මුස්ලිම් අන්තවාදී
කණ්ඩායමක් කලේ කියලා.
ෆානිමා අදුරනවද?
මොකක්? මං අදුරන්නෙ නෑ!
ෆිල්ම් එක බලන්න වෙන්නෙ නැනේ?
ඔවු මේ ටිකේ ගෙදරම
ඉන්න
Safety Check
Terrorist Attack in Sri Lanka
SAFETY CHECK
You appear to be in the area affected by
the terrorist attacks in Sri Lanka
Are you safe ?
I'm safe
I'm not in the area


ලෝගන් මේක පෝස්ට් කලා?
!!
Nisha shared a post
1 hour ago
BFF
Fathima left the group.
මගේම යාළුවෝ මෙහෙමද හිතන්නෙ?
මන් හිතුවෙ එයාල මගෙ යාළුවෝ කියල.
Zahara
Are you sure you want to deactivate your account ?
Deactivate
පුතේ කන්න එන්න.
ඔහොම නොකා ඉන්න හොඳ නෑ.
ටොක්
ටොක්
මට කන්න බෑ.


ඇයි දන්නෑ?
මං මැසේජ් කලා. රිප්ලයි නෑ.
එයා ගෘප් එකෙනුත් අයින් උනා නේ.
කෝ ෆානිමා?
මං මේ කෝල් කරනවා.
ෆානිමාගේ මිතුරන් ශෙයාර් කල දෙවල් දැක ඇය ගොඩක් දුක් උනා.
ඔබ ශෙයාර් කරන දේ ඔබ නොසිතන කෙනෙකුට රිදවිය හැක.

උගත් පාඩම්

වෙරී ප්‍රකාශයන් ට ප්‍රතිචාර දක්වන ආකාරය

ඒවා බෙදාහැරීමෙන් වළකින්න

ඔබ බෙදා හරින වෙරී ප්‍රකාශයන් යමෙකුට රිදවිය හැක. එමෙන්ම ඔබ එය බෙදා හැරීමෙන් පසු, එය බෙදාහැරියේ ඔබ බව සොයාගැනීමට හැකියාව ඇති නිසා එමගින් ද ඔබට බලපෑමක් එල්ල විය හැක. උදාහරණයක් ලෙස මෙනුරගේ ඩිජිටල් පියසටහන් නිසා ඔහුට ලැබීමට තිබූ ශිෂ්‍ය නායක පදවිය අහිමි වීම දැක්විය හැක.

පැමිණිලි කරන්න

බොහෝ වෙබ් අඩවිවල පනවා ඇති ප්‍රජා මාර්ගෝපදේශන, වෙරී ප්‍රකාශ මගින් උල්ලංඝනය වේ. එයින් අදහස් වන්නේ වෙරී ප්‍රකාශයන් එම වෙබ් අඩය ක්‍රියාත්මක වන ආකාරයට පටහැනි බවයි. එනිසා ඔබට වෙරී ප්‍රකාශයන් බෙදා හරින පුද්ගලයින් ගැන ඔබගේ අනන්‍යතාව හෙළි නොකරමින් පැමිණිලි කළ හැක

වැඩිහිටියෙකු සමග සාකච්ඡා කර, අදාළ වෙබ් පිටුව ගැන බලධාරීන්ට වාර්තා කළ යුතුදැයි විමසන්න.

අවහිර කරන්න

වෙරී ප්‍රකාශ සිදුකරන පුද්ගලයින්ව ඔබට ඔබගේ සමාජ මාධ්‍ය ජාලා ගිණුම්වලින් අවහිර කළ හැක.

ඔබේ හඬ අවදි කරන්න

අදාළ අදහස සමඟ එකඟ නොවන බව ඔබට සෘජුවම පැවසිය හැක.

- අදාළ ලිපිය පළ කළ පුද්ගලයාට එරෙහිව නොව, එහි අන්තර්ගතයට එරෙහිව කථා කරන්න.
- අදාළ ලිපියේ ඇති ව්‍යාජ හෝ වැරදි ප්‍රකාශ වලට හැකි තරම් සාධක සහිතව එරෙහි වන්න. විශ්වාසදායක මූලාශ්‍ර වෙත යොමු වන්න.
- ඔබේ අදහස ගෞරවාන්විතව ප්‍රකාශ කරන්න. අපහාස කිරීම් හෝ බහින්බස් වීම් වලට පැටලීමෙන් වළකින්න.




කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන චිත්‍ර: සුගප්‍රදා සෝමාස්කන්ද අයියර්


ඩිජිටල් ක්‍රියාකාරිත්වය

හැඳින්වීම

ක්‍රියාකාරීත්වය යනු සමාජීය හෝ දේශපාලන වෙනසක් ඇති කිරීමේ අරමුණින් සාමකාමීව ප්‍රශ්න කෙරෙහි අවධානය කිරීමයි..

ඩිජිටල් ක්‍රියාකාරිත්වය (හෙවත් සයිබර් ක්‍රියාකාරිත්වය) යනු අන්තර්ජාලය සහ අනෙකුත් ඩිජිටල් තාක්ෂණයන් ජනතාව දැනුම්වත් කිරීමට හා ප්‍රශ්න සඳහා විසදුම් සෙවීමට භාවිත කිරීමයි.















ක්‍රැක්!


ආණ්ඩුව ගනන් ගන්නේ නෑ.
පෙත්සමට උත්තරේකුත් නෑ.
දැන් අවුරුද්දකුත් උනා.
නාම හදල නෑ.
ආපු දෙන්කොට් ඊලඟ ඡන්දෙට.
අපිට මුකුත් කරන්න බැරිද?
අපි වීඩියෝ එකක් හදමු.
එක හොඳයි.
ඒක ඉන්ටර්නෙට් එකේ දාමු.



REC




ගංවතුර හේතුවෙන් පාලම කැඩී වසරක් ගතවී ඇත. රජය පාලම නැවත ඉදිකරන බවක් නොපෙනේ. #fixthebridge


පෝස්ට් එක වයිරල් ගියා.
Share
ගංවතුර හේතුවෙන් පාලම කැඩී වසරක් ගතවී ඇත. රජය පාලම නැවත ඉදිකරන බවක් නොපෙනේ.#fixthebridge


24000
ශෙයාර්ස්!!!
මේ නැති වෙන්නෙ
මගේ ඡන්ද පදනම.
පාලම
හදපල්ලා.


ඔබේ ජංගම දුරකථනය සහ
අන්තර්ජාලය භාවිතයෙන්
ඔබට සමාජයේ ගැටළු කෙරෙහි
අවධානය යොමු කිරීම සහ ඔබේ
ප්‍රජාවේ ගැටළු වලට විසඳුම්
සෙවීමද කල හැක.

උගත් පාඩම්

බොහෝ සාර්ථක අන්තර්ජාල ක්‍රියාකාරීන් විවිධ උපායමාර්ග යොදාගෙන ඇත.
එහි උදාහරණ කිහිපයක් පහතින්:

අන්තර්ජාල පෙත්සම්:

නිවැරදි ප්‍රතිචාර ලැබේ නම් මෙය විශිෂ්ට මෙවලමකි. සමහර පෙත්සම්වල ලක්ෂ සංඛ්‍යාත පුද්ගලයින් අත්සන් කර ඇත. මෙය සිදු කළ විට අදාළ රජයන්ට සහ ආයතනවලට එය නොසලකා හැරීමට අවස්ථාවක් නැත.

හෑෂ්ටැග් (Hashtag):

හොඳ හෑෂ්ටැග් එකක් ඔබ බෙදාගන්නා තොරතුරු වර්ග කිරීමට උපකාරී වන අතර, පරිශීලකයන්ට ට්විටර්, ඉන්ස්ටග්‍රෑම්, ෆේස්බුක්, රෙඩිට් සහ යුටියුබ් වැනි සමාජ මාධ්‍ය හි නිශ්චිත මාතෘකා සහිත පණිවිඩ සොයාගැනීමේ හැකියාව මින් ලැබේ.

සයිබර් සුරාකෑම සහ ප්‍රවර්ධනත්වය



කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන චිත්‍ර: ට්‍රිෂාන් ප්‍රනාන්දුපුල්ලේ

සයිබර් සුරාකෑම සහ ප්‍රවණ්ඩත්වය

හැඳින්වීම

සයිබර් හිරිහැර යනු යමෙකු ඩිජිටල් මෙවලම් භාවිතයෙන් අන්තර්ජාලයේ අන් අයට හිරිහැර හෝ අයුතු බලපෑම් කිරීම යි. කටකතා පළකිරීම, තර්ජනය කිරීම හෝ යමෙකුගේ කැමැත්තෙන් තොරව ඔවුන්ගේ පුද්ගලික තොරතුරු අන්තර්ජාලයට ඇතුළත් කිරීම යන දේවල් මෙවැනි හැසිරීම්වලට ඇතුළත් වේ. ඔබගේ ආගම, භාෂාව හෝ ඔබේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවයට සම්බන්ද හිරිහැර කිරීම ද මෙයට ඇතුළත් ය.

ඔබ සයිබර් හිරිහැරයන් ට ලක්වී ඇත්නම්, ඔබට පහත ක්‍රියාමාර්ග ගත හැක:


වැඩිහිටියෙකුට (ඔබේ දෙමාපියන්ට හෝ ගුරුවරයාට) දැනුම් දෙන්න.

ඔබ වයස අවුරුදු 18 ට අඩු නම් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියට වාර්තා කරන්න.

ඔබ වයස අවුරුදු 18 ට වැඩි නම් පොලිස් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ අංශයට වාර්තා කරන්න.

ශ්‍රී ලංකා පරිගණක හදිසි සුදානම් කණ්ඩායමට (SL-CERT) වාර්තා කරන්න.


මේ චාරුකා.
අද ඉදන් එයා
අපේ පන්තියට
එකතු වෙනවා.
හලෝ
හලෝ චාරුකා


ඊළඟ දවස
කවුද මේකට උත්තරේ දන්නේ?
$A^2+B^2=C^2$
4
3
?
පහයි.
හරිම හොඳයි චාරුකා.
අපිට කට්ටිය ඇති වෙන්න ඉන්නවා..
මාත් එන්නද?


සුභ උදෑසනක්.
මෙතන වාඩි වෙන්න බෑ.

ඔයා හරිම වානයක්.

කවුරුවත් ඔයා එක්ක සෙල්ලම් කරන්න ආසා නෑ.

ඔයාට කවුරුත් කැමති නෑ.

ඔයා ආපු දිහාවකට ආපහු යන්න.

ඔයා හරි ඇණයක්.

මට ඔයාගේ පරණ ෆොටෝ එකක් හම්බුනා@Charuka.



ඔයාට කවුරුත් නෑ

ඔයාගේ කිසි ලක්ෂණයක් නෑ

ඔයාගෙන් කිසි වැඩක් නෑ






එයාල මගේ යාළුවෝ කියල හිතුවෙ.
Print Screen
Scroll Lo
I found
of you
Save post
View edit history
Embed
Turn on post notifications
Report
අම්මේ, ඉස්කෝලෙ ළමයි එකක් මට අන්තර්ජාලයෙන් හිරිහැර කරනවා.
මොකක්? දන්නවද ඔයා එයාලා කවුද කියලා?
ඔව් මම ඔක්කොම සේව් කරා.
මම කෝල් කරනවා විදුහල්පතිට.


දන්නවද? මේ වැඩේට ඔයාල හිරේ යන්න පුලුවන්. හොඳ වෙලාවට මෙයාල පොලීසි යන්නෙ නැත්තේ.
මං තුන්දෙනාගෙම පන්ති තහනම් කරනවා.
1
අපිට සමා වෙන්න චාරුකා.
චාරුකා වගේ ඔබවත් අන්තර්ජාලයේ හිරිහැර වලට ලක් වෙනවා නම්,සාක්ෂි තබාගන දෙමාපියන්ට හෝ ඔබට විශ්වාසවන්ත ගුරුවරයෙකුට දැනුම් දෙන්න.
අන්තර්ජාලයේ හිරිහැර කිරීම හා වෛරය පැතිරවීම බරපතල ප්‍රතිවිපාක ගෙන දිය හැකිය.

උගත් පාඩම්

ඔබට යමෙක් තර්ජනය කරන්නේ නම්, කියූ දේවල තිරපිටපත් (screenshots) ගන්න.
මෙය වැදගත් සාක්ෂියකි.

සිදු වී ඇති දේ පිළිබඳ තිරපිටපත් සමග වාර්තාවක් තබා ගන්න. සයිබර් හිරිහැර සිදු වූ දිනය හා වේලාව සමග කියූ දේ සටහන් කරගන්න.

බිජිටල් අනාගතය සොරකම



කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන

චිත්‍ර : මේවී ටෑන්

ඩිජිටල් අනන්‍යතා සොරකම


හැඳින්වීම


අනන්‍යතා සොරකම් අන්තර්ජාලයේ සහ ඉන් පිටත දී ද සිදුවිය හැක. යමෙකුගේ අවසරයකින් තොරව, ඔහුගේ හෝ ඇයගේ පුද්ගලික තොරතුරු රැස් කිරීම සහ අපරාධ ක්‍රියා සඳහා එම තොරතුරු භාවිතා කිරීම මීට අදාළ වේ. වෙනත් පුද්ගලයෙකුගේ ණයවරපත් (credit card) හෝ හරපත් (debit card) විස්තර භාවිතා කර, ඔවුන්ට අයත් නොවන මුදල් වියදම් කිරීම මීට උදාහරණයක් ලෙස දැක්විය හැක.

යමෙකුගේ අනන්‍යතාවය සොරකම් කළ හැකි ක්‍රම කිහිපයක් තිබේ, එක් ක්‍රමයක් වන්නේ තතුබෑම් (phishing) කිරීමයි. මෙම ක්‍රමය අපරාධකරුවන් විසින් යම්කිසි සංවිධාන (බැංකුවක් හෝ සමාගමක්) ලෙස පෙනී සිටී. සාමාන්‍යයෙන් මෙය සිදු කරනු ලබන්නේ පුද්ගලයන්ගෙන් විද්‍යුත් පණිවිඩ හෝ කෙටි පණිවිඩ හරහා පුද්ගලික මූල්‍ය තොරතුරු ඉල්ලා සිටීමෙනි.



CITY BANK
WELCOME
CITY BANK
Check
100,000/=
K M තැම්බිලි
Thambili@fruitmail.com
+94 7781 854 872
අද නම් මරු දවස.
සිටි බැංකුවෙන් දැනුම්දීමක්
රුපියල් 100,000.00 මුදලක්
ඔබේ ගිණුමට බැර කර ඇත.
වර්තමාන ගිණුමේ ශේෂය
රුපියල් 446,000.00
CITY BANK
WELCO



හිතවත් තැඹිලි මහතාණෙනි,
සුභ පැතුම්! ...





https://fruitmail.com/mail/inbox
හිතවත් තැඹිලි මහතාණෙනි,
සුභ පැතුම් !!!
විශ්වාසවන්ත ගූගල් ක්‌රෝම් පාරිභෝගිකයෙක් වන ඔබව ස්මාර්ට් ජංගම දුරකථනයක් තෑගි කිරීමට ඔබ අහඹු ලෙස තෝරාගෙන ඇත.
එම ත්‍යාගය ලබා ගැනීමට ඔබ තැපැල් ගාස්තු වන ඩොලර් 12.95 මුදල ගෙවිය යුතු වේ.
මෙතනින් ගෙවන්න: http://chromloyalty.com
ස්තුතියි,
ගූගල් ක්‌රෝම් ලෝයල්ටි කණ්ඩායම


ශා...
මම ෆෝන් එකක් දිනලා.


http://chromloyalty.com/Pay
CARD INFORMATION
Name on Card K.M Thambili
Card Number 4213 4785 6316 7531
CVV 231
Expiration Date 05/06/2020
SUBMIT
ක්ලික්


http://chromloyalty.com/Pay
ස්තුතියි.
ඔබගේ ගෙවීම සාර්ථකයි
අපි ඔබට ස්මාර්ට් ජංගම දුරකථනය හැකි ඉක්මනින් එවන්නෙමු.


යේ... ඔයාගේ සල්ලි ඔක්කොම දැන් මගේ.
හා හහ් හා...


ALERT
CITY BANK
කොහොමද මේක උනේ?
මොකක්ද?
සිටි බැංක්කුවෙන් දැනුම්දීමක්
රුපියල් 446,000.00 මුදලක්
ඔබේ ගිණුමෙන් හර කර ඇත.
වර්තමාන ගිණුමේ ශේෂය
රුපියල් 0.00
අයියෝ!
මගේ සල්ලි ඔක්කොම
කොහෙද ගියේ?
තැඹිලි මහතා තනුබෑම් ඊමේල්
පණිවිඩයක් විශ්වාස කර
ඔහුගේ පුද්ගලික තොරතුරු
ලාබා දුන් නිසා ඉතිරි කළ මුදල්
සියල්ලම ඔහුට නැති උනා.
අන්තර්ජාලයේ පුද්ගලික තොරතුරු
ලාබා දීමේදී ප්‍රවේසම් වන්න.

උගත් පාඩම්

තතුබෑම් (phishing) වලින් ආරක්ෂා වීමට උපදෙස්

- ඔබේ බැංකු තොරතුරු විමසන සැකකටයුතු වෙබ් අඩවිවලට ප්‍රවේශ වීමෙන් වළකින්න.
- කිසියම් සැක සහිත ගනුදෙනුවක් සිදු වී තිබේදැයි තහවුරු කරගැනීමට ඔබේ ණයවරපත් සහ බැංකු මුල්‍ය ප්‍රකාශන පිළිබඳව සැමවිටම දැඩි සැලකිල්ලක් යොමු කරන්න.
- මුල්‍ය ගනුදෙනු සඳහා ආරක්ෂිත වෙබ් අඩවි පමණක් භාවිතා කරන්න. මිල දී ගැනීමක් සඳහා ඔබේ ණයවරපත් තොරතුරු අන්තර්ජාලයේ ඇතුළත් කරන විට, සාමාන්‍යයෙන් නම් එම වෙබ් අඩවි තීරුවේ වම් කෙළවරේ අගුලක ලාංඡනයක් පෙනෙන්නට තිබිය යුතුයි. එවැන්නක් නොමැති නම්, ඔබේ තොරතුරු ඇතුළත් කිරීමෙන් වළකින්න.
- ඔබේ බැංකුව හෝ විශ්ව විද්‍යාලය වැනි පිළිගත් ආයතනවලින් යැයි කියමින් පුද්ගලික තොරතුරු ඉල්ලා සිටින විද්‍යුත් පණිවිඩවලට පිළිතුරු දීමෙන් වළකින්න. මෙම සැක සහිත විද්‍යුත් පණිවිඩ ගැන අදාළ ආයතනය අමතා තොරතුරු තහවුරු කරගන්න.
- සාමාන්‍ය සංවේදනය, දැනීම පාවිච්චි කරන්න. “පැරිසියට නොමිලේ සංචාරයක් දිනාගැනීම සඳහා ඔබේ ක්‍රෙඩිට් කාඩ් අංකය ඇතුළත් කරන්න!” වැනි අදහාගත් නොහැකි දීමනාවක් හිමිවන බව පැවසෙන්නේ නම්, එය වංචාවක් වීම සඳහා ඉහළ සම්භාවිතාවක් තිබේ.
- පොදු වයිෆයි කලාපවල වයිෆයි පහසුකම් භාවිතා කරන විට පුද්ගලික තොරතුරු හුවමාරු ගැනීමෙන්වළකින්න. පොදු වයිෆයිවල ආරක්ෂාව අඩු අතර, ඒවා පහසුවෙන් "හැක්" කළ හැක.
- නෝර්ටන් ප්‍රති-වයිරස සමාගමෙන් හෝ එවැනි වෙනත් සමාගමකින් එවන ලද්දක් බව පවසමින්, යමක් බාගත කරගැනීම සඳහා ඔබව පොළඹවන විද්‍යුත් පණිවිඩ ගැන අවධානයෙන් සිටින්න. එම විද්‍යුත් පණිවිඩයට පිළිතුරු සැපයීම මඟහැර, ඔබම ඒ සමාගම හා සම්බන්ධ වී අදාළ තොරතුරුවල සත්‍ය අසත්‍ය බව සැක හැර දැනගන්න.